HRP Bringing HR to the Forefront

AON Hewitt
McLagan | Radford

HRM AWARDS 2012

The Association of
Human Resource Professionals
18/4, Evergreen Park Road (off Dabare Mawatha), Narahenpita, Colombo 05.
Telephone: +94 11 566 7575 E-mail: hrpsrilanka@gmail.com, www.hrp.lk
Visit our facebook page "Association of Human Resource Professionals"

# මානව සම්පත් කළමනාකරණ සම්මාන ප්‍රදානය 2012
# ජාතියේ විශිෂ්ට මානව සම්පත් ක්‍රියාකාරකම් උදෙසා සම්මාන පිරිනැමීම

මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය මගින්, විශිෂ්ටතම මානව සම්පත් කළමනාකරණ කාර්යයන් සම්බන්ධයෙන් වන විශිෂ්ට ක්‍රියාකාරකම් උදෙසා පිළිගත් මං සළකුණක් වන මානව සම්පත් ක්‍රියාකාරකම් සඳහා වූ සම්මාන ප්‍රදානෝත්සවය 5 වැනි වරටත් 2012 වසරේදී අති උත්කර්ෂවත් අන්දමින් පවත්වනු ලබයි. ජාත්‍යන්තර වශයෙන් පිළිගත් නිර්ණායකයන් සමග තමන්ගේ මානව සම්පත් කළමනාකරණ ක්‍රියාකාරකම්වල ඵලදායීතාව ඇගයීමට ලක් කිරීමට මානව සම්පත් ක්‍රියාකාරකම් සඳහා වූ මෙම සම්මාන ප්‍රදානෝත්සවය, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සමාගම්වලට මනා වේදිකාවක් සපයාදීමට අපේක්ෂිතය. තම නවීන චින්තනය සහ ක්‍රමවේදයන් මගින් මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ නව ප්‍රවණතාවයන් බිහි කරන ලද ආයතනයන් හි උද්‍යෝගය සහ කැපවීමට ගෞරවය දක්වන ගෞරවණීය ඇගයීමක් වශයෙන් පුළුල් පිළිගැනීමක් සහිතව, මානව සම්පත් "සුපිරි 10" අතරට ගැනෙන මෙය ඉතා විශිෂ්ට අයුරින් ජාත්‍යන්තර පිළිගැනීමට ලක්ව තිබේ.

මානව සම්පත් ක්ෂේත්‍රයේ විශිෂ්ටතා හඳුනාගැනීම සහ උපහාර පිදීමේ උළෙලක් වශයෙන් මානව සම්පත් කළමනාකරණ සම්මාන ප්‍රදානෝත්සවය 2002 වසරේ සිට ද්වි වාර්ෂිකව පවත්වා තිබේ. ශ්‍රී ලංකාවේ "විශිෂ්ටතම මානව සම්පත් ක්‍රියාකාරකම්" ඇගයීම සඳහා මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය මගින් මූලිකව ඇරඹූ මෙය, වර්තමානය වන විට මෙරට මානව සම්පත් ක්‍රියාකාරකම් විශිෂ්ටත්වය අතින් " සුපිරි 10" අතුරින් එකක් බවට පත්වීමට මහා පරිමාණ සහ සුළු පරිමාණ ව්‍යවසායකයින් එකසේ තරග වදින වේදිකාවක් බවට පත් වී තිබේ.

ව්‍යාපාර ලොව තුළ සිදුවන වේගවත් වෙනස් වීම්වලට අනුගත වීම සඳහා ආරම්භයේ සිටම ඇගයීමේ ක්‍රියාපිළිවෙල වාඩත් ක්‍රමවත්ව සකසමින්, ආයතනයන් හට මෙන්ම මානව සම්පත් වෘත්තිකයන්ට ද අනපේක්ෂිත අභියෝගයන් මඟහරවා ගනිමින් නවීන ව්‍යාපාරික ක්‍රම වේදයන් දෛනිකව පවත්වාගැනීම පිළිබඳව දේශීය සමාගම්වල අභ්‍යන්තර මානව සම්පත් කළමනාකරණයන් වඩාත් පළදායී ලෙස ඇගයීමේ පරිපූර්ණ ක්‍රම වේදයන් රැසක් 2012 මානව සම්පත් කළමනාකරණ සම්මාන ප්‍රදානය වෙනුවෙන් දැන් සකසා තිබේ. මෙම වසරේ සම්මාන උළෙලේදී පෞද්ගලික අංශය සඳහා ස්වර්ණ සම්මාන 10ක් ද, රිදී සම්මාන 10ක් ද, විශේෂ සම්මාන 6ක් ද ප්‍රදානය කෙරෙනු ඇත. විශේෂ ස්වර්ණ සහ රිදී සම්මාන 3ක් ද සහිතව රජ්‍ය අංශය ද සහභාගී වීම මෙම වසරේ සම්මාන ප්‍රදාන උළෙලේ විශේෂත්වයක් වනු ඇත.

ප්‍රමුඛ පෙළේ දේශීය සහ ජත්‍යන්තර මානව සම්පත් වෘත්තිකයන් සහ කර්මාන්තකරුවන්ගෙන් සැදුම්ලත් විනිශ්චය මණ්ඩලය මගින් එක් එක් අදාල ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඵලදායීතා වර්ධනය, සේව්‍ය ප්‍රවර්ධනය නංවාලීම ආදිය මගින් තම ආයතනයන් හි තරගකාරී බව සහ දිගුකාලීන ප්‍රතිලාභ අත්කර ගැනීම ආදිය සඳහා ඇති කර තිබෙන ක්‍රම වේදයන් ඇගයීමට ලක් කරනු ඇත. පුළුල් ප්‍රශ්න මාලාවක ආකාරයෙන් විද්‍යාත්මකව සකසා තිබෙන ඇගයීමේ ක්‍රමය මගින්, AON හියුවිට් මගින් සකසා තිබෙන සම්මත ක්‍රම වේදයන් සහ ලක්ෂණයන්ට අනුකූලව ඇගයීමක්, සහභාගි වන්නන් සඳහා පළමුවෙන් සිදු කෙරේ.

President
Gayathri Chakravarthy
Distilleries Company of Sri Lanka PLC

Vice President
Chiranthi Cooray
Hatton National Bank PLC

Vice President
Asitha Jayatunga
Expolanka Holdings PLC

Secretary
Thilan Perera
HNB Assurance PLC

Treasurer
Maduka Rathnaweera
CIC Holdings PLC

Asst. Secretary
Chathuskka Seneviratne
Aitken Spence PLC

Asst. Treasurer
Dinali Peiris
MAS Holdings

Immediate Past President
Isuru Tillakawardana
Commercial Bank of Ceylon PLC

Committee
Ishan Dantanarayana
Brandix Group

Nalin Pasqual
Asiri Group of Hospitals

Dimuth De Alwis
Hemas Holdings PLC

Pulasthika Wirasinha
John Keells Holdings PLC

Harshana Dassanayake
Dialog Axiata PLC

Surani Amerasinghe
Ceylon Tobacco Company PLC

Dilrukshi Kurukulasuriya
Diesel & Motor Engineering PLC

Chathurika Amarakoon
Unilever Sri Lanka Ltd

Zehran Fareed
John Keells Hotels

Chitral Perera

එමගින් තෝරාගන්නා ආයතනයන් නිශ්චිත පටිපාටයක් මත AON හියුවිට් හි ස්වාධීන ඇගයීම් මණ්ඩලයක් මගින් වර්ගීකරණය සහ ඇගයීම අනතුරුව සිදු කෙරේ. ඊට අනුකූලව ලකුණු ලබාදීම සිදුකෙරෙන අතර 2012 ජූලි මාසයේ පැවැත්වෙන මානව සම්පත් කළමනාකරණ සම්මාන රාත්‍රිය උත්සවයේදී " සුපිරි 10 " ස්වර්ණ සහ රිදී සම්මානලාභීන් නිවේදනය කෙරේ. ආයතනයන් ලබාගත් ලකුණු/ විශිෂ්ටතා මත පදනම් වූ සංකේත අංකයක් මගින් පමණක් එම ආයතන හඳුන්වමින්, ඇගයීම් ක්‍රියාදාමය මුළුල්ලේම ඉහළ රහස්‍යභාවයක් රැකගනිමින් ජයග්‍රාහකයන් ස්ථිරවම අනුමත කිරීමෙන් අනතුරුව පමණක්, සහභාගී වූ ආයතනයන් හි නම් විනිශ්චයකරුවන්ට, කමිටු සාමාජිකයන්ට සහ මහජනතාවට නිකුත් කරනු ලැබීම ස්වාධීන ඇගයීම් ක්‍රම වේදයේ ප්‍රධාන ලක්ෂණයක් වේ.

වත්මන් ගෝලීය ප්‍රවණතාවයන්ට අනුකූලව මානව කුසලතා කළමනාකරණය සම්බන්ධයෙන් අදාල වන අනෙකුත් ක්ෂේත්‍රයන් මෙන්ම මානව සම්පත් කළමනාකරණ සම්මාන සඳහා යොදාගන්නා විශිෂ්ට ක්‍රමවේදයන් පිළිබඳව අධ්‍යයන සම්මන්ත්‍රණයක් ද සම්මාන උළෙලට සමගාමීව පැවැත් වේ. මානව සම්පත ආයතනයන් හි දිගු කාලීන වර්ධනයට ඉවහල් වනුයේ කවරාකාරයෙන් දැයි, ව්‍යාපාර ප්‍රධානීන්ටත්, ප්‍රධාන විධායක නිලධාරීන්ටත්, ප්‍රධාන මූල්‍ය නිලධාරීන්ටත්, මානව සම්පත් වෘත්තිකයන්ටත් තම අදහස් ප්‍රකාශ කරමින් සාකච්ඡා කිරීම සඳහා 2012 අධ්‍යයන සම්මන්ත්‍රණය වේදිකාවක් වනු ඇත. කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව සඳහා මානව සම්පත් උපමානයන් ආදී තාක්ෂණික ප්‍රබලත්වයෙන් යුත් සැසිවාරයන් ද සමගින් සේව්‍ය වර්ගීකරණ සමානත්වය, ඉහළ සේවක දායකත්වය තුළින් ROI සේව්‍ය වර්ගීකරණ අනාගත සේවා ස්ථාන සැකසීම ආදී විවිධ වටිනාකම් සහිත චින්තනයන් පිළිබඳව ද සාකච්ඡා කෙරෙනු ඇත. මානව සම්පත් කළමනාකරණ සම්මාන ප්‍රදාන අධ්‍යයන සම්මන්ත්‍රණයේ දේශකයන් වශයෙන් දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් කීර්තියක් දරණ විද්වතුන් සහභාගීවන අතර එය මානව සම්පත් කළමනාකරණ සම්මාන උළෙලට පූර්වාංගම වශයෙන් පැවැත්වෙනු ඇත.

ලෝකයේ විශාලතම මානව සම්පත් උපදේශන සහ සැපයීම් සේවා සපයන්නා වන AON හියුවිට් ඇසෝසියේට්ස් ඉන්දියා ආයතනය ද, මානව සම්පත් කළමනාකරණ සම්මාන 2012 සඳහා හවුල්කරුවෙකු වනු ඇත. රටවල් 90ක කාර්යාල 330කට අධික සංඛ්‍යාවකින් ද, ඇ.ඩො. බිලියන 4.3 පමණ වාර්ෂික ඒකාබද්ධ ආදායමක් සහ තම සේවාදායකයන් වශයෙන් ගෝලීය ෆෝචූන් 500 සමාගම් 80%ක ප්‍රමාණයකින් ද සමන්විත AON හියුවිට් ආයතනය, සංස්ථාවන් හි කුසලතා, ලාභ සහ මූල්‍ය ගැටලු විසඳීමේලා ප්‍රසිද්ධියක් උසුලයි. මානව සම්පත් කළමනාකරණ සම්මාන 2012 උළෙලේ ප්‍රධාන හවුල්කරු වශයෙන් AON හියුවිට් විසින් සැමට පොදුවේ ප්‍රතිලාභ අත්වන ආකාරයෙන් තම පළපුරුද්ද සහ පරිචය යොදාගනිමින් මෙම සම්මාන උළෙලට විශේෂත්වයක් එක් කරනු ඇත. මානව සම්පත් කළමනාකරණ සම්මාන 2012 සඳහා ප්ලැටිනම් අනුග්‍රාහකයා වශයෙන් ඩීසල් ඇන්ඩ් මෝටර් ඉංජිනියරින් පී. එල්. සී ( DIMO) ආයතනය ද, බ්‍රෝන්ස් අනුග්‍රාහකයා වශයෙන් සී. අයි. සී (CIC) ආයතනය ද සහ නිල ශ්‍රව්‍ය දෘෂ්‍ය හවුල්කරු වශයෙන් DAV Technologies ආයතනය ද කටයුතු කරනු ඇත.

මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය
2012. 01. 24